# පෙත්සමට වැට......... පාරට ඉඩ.........

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරකපිටිය ගමට ඇතුලු වීමේ මාර්ගය පුළුල් කර ගැනීමට වසර ගණනාවක් තිස්සේ ගෙන ගිය අරගලය ජයග්‍රහණයෙන් අවසන් කර ගැනීමට තොරතුරු අයිතිය හේතු වූ බව වරකපිටියේ පදිංචි සිරිසේන මහතා පවසන්නේ ඉමහත් සතුටිනි.

සිරිසේන මහතා සහ ගම්වාසීන් විසින් 2014 වසරේ වැලිගම ප්‍රදේශීය සභාවෙන් මෙම මාර්ගය අඩි 10ක පාරක් ලෙස සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. ඔක්තෝම්බර් මාසයේ දී එම ඉල්ලීම සදහා වැලිගම ප්‍රාදේශීය සභාවේ අනුමැතිය හිමි වූ අතර 2015 මැයි 22වන දින එම අනුමැතිය ගැසට් කරන ලදී. කෙසේ වෙතත් ඉන් පසු ප්‍රාදේශිය සභා විසිරුවා හැරීම හේතුවෙන් ගැසට් නිවේදනය නිකුත් වුවද මාර්ගය සංවර්ධනය කිරීම අතර මග ඇණ හිටින ලදී.

නමුත් ගම්වාසීන් තම අරමුණ කෙසේ හෝ ඉටු කර ගත යුතුය යන අරමුණෙහි පිහිටා සිටිමින් මෙම අරගලයෙහි දිගින් දිගටම නිරත වූ අතර ඔවුන් විසින් වගකිවයුතු ආයතනයන්ට මේ පිළිබද දැනුම් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යන ලෙස වැලිගම ප්‍රදේශිය සභාවේ ලේකම්වරයාට උපදෙස් ලැබී තිබූ අතර ලේකම්වරයා විසින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යාමට මූලික මැනුම් කටයුතු ආරම්භ කරන ලදි. නමුත් 2018 දෙසැම්බර් 14 වැනි දිනට යෙදී තිබූ අවසන් මැනුම් ඉල්ලීම ප්‍රාදේශීය සභාව මැදිහත් වීමෙන් හදිසියේ අත්හිටුවන ලදී.

සිරිසේන මහතා අප ආයතනයේ සහයෝගයෙන් තොරතුරු අයදුම්පතක් ඉදිරිපත් කර මැනුම අතරමග හදිසියේ නතර කිරිමට හේතු කවරේදැයි ප්‍රාදේශිය සභාවෙන් විමසා සිටින ලදී. ඉන් පසුව කල අභියාචනයට ලැබුණු පිළිතුර වුයේ වරකපිටිය මාර්ගය සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රදේශවාසින් පිරිසක් විරෝධය පළ කර ඇති බැවින් අවසාන මැනුම් නියෝගය නතර කළ බවයි.

එහි වැඩිදුරටත් සදහන් වුයේ මාර්ගයේ කොටසක් පමණක් සංවර්ධනය කිරීමට එම පිරිස අකමැත්ත පළ කර ඇති බවයි. කෙසේ වෙතත් සිරිසේන මහතා ඇතුළු ගම්වාසීන්ගේ අදහස වුයේ එම මාර්ගයෙහි සංවර්ධනය කිරිමට ඉතිරි කොටසක් නොමැති බැවින් මෙම පිළිතුරු නොමග යවන පිළිතුරක් බවයි.

ඒ අනුව නැවත වරක් ක්‍රියාත්මක වු සිරිසේන මහතා එම මාර්ගය සංවර්ධනයට විරෝධය කළ කරමින් පෙත්සම් එවන ලද අය කවුරුන්ද යන්න හා එම පෙත්සම් වල පිටපත් නැවත තොරතුරු පනත යටතේ ඉල්ලා සිටින ලදී.

ඒ අනුව එම තොරතුරු අයදුම්පත්‍රයට පිළිතරු ලැබුණු අතර එම පෙත්සම් හා එම පෙත්සම් යොමු කරන ලද පුද්ගලයන් පිළිබද සොයා බැලිමේ දී පැහැදිලි වුයේ එවා ඇති පෙත්සම් ප්‍රමාණය 4ක් පමණක් බවත් එම පෙත්සම්කරුවන්ද එම සංවර්ධනය සදහා යෝජිත මාර්ගයේ පදිංචි අය නොවන බවත්ය. පසුව ප්‍රාදේශීය සභාවට විරෝධය පල කිරීමට සිරිසේන මහතා ඇතුළු ගම්වාසින් සූදානම් වු අතර එකී විරෝධයට පෙර සභාව විසින් යෝජිත මාර්ගය දින 3ක් වැනි කෙටි කලක දී කඩිනමින් සංවර්ධනය කර දෙන ලදී.

**තොරතුරු දැනුම** 2020 පෙබරවාරි ප්‍රකාශයේ ප්‍රශ්න සදහා නිවැරදි පිළිතුරු, (ප්‍රශ්න අංක 01 - වර්ෂ 2016) (ප්‍රශ්න අංක 02 - වැඩකරන දවස් 14ක් තුළ)

පහත ප්‍රශ්න වලට පිළිතුරු අප වෙත එවන්න

**ප්‍රශ්න අංක 01.**
පැය 48ක් ඇතුලත තොරතුරු ලබාගත හැක්කේ පහත සදහන් කුමන පදනම යටතේ තොරතුරු අයදුම්පත්‍රයක් යොමු කිරීමෙන් ද?
A. ජීවිතයට බලපෑමක් ඇති විට
B. පුද්ගලික නිදහස ට බලපෑමක් ඇති විට
C. ජීවිතයට සහ පුද්ගලික නිදහස ට බලපෑමක් ඇති විට
D. ඉහත එකක්වත් නොවේ

**ප්‍රශ්න අංක 02.**
පොදු අධිකාරියකට යොමු කළ තොරතුරු අයදුම්පත්‍රයක් වෙනුවෙන් අභියාචනා නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැක්කේ පහත සදහන් කවර කාලසීමාව තුලද?
A. වැඩකරන දවස් 14ක් ඇතුලත B. සාමාන්‍ය දවස් 14ක් ඇතුලත
C. වැඩකරන දවස් 21ක් ඇතුලත D. සාමාන්‍ය දවස් 21ක් ඇතුලත

**මෙම ප්‍රශ්න සඳහා ඔබගේ පිලිතුරු අපගේ 077 432 3285 දුරකථන අංකයට**
<**ඔබගේ නම**> space <**ලිපිනය**> space <**පිලිතුර 01**> space <**පිලිතුර 02**> **සමග කෙටි පණිවිඩයක් ලෙස යොමු කරන්න.**

**ඔබට මෙම පුවත් හසුන අවශ්‍ය නොවේනම් කරුණාකර පහත ලිපිනයට හරවා එවන්න**


TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා**
**නො.5/1, එලිබෑන්ක් පාර,**
**කොළඹ 05.**

**දුරකථන:** (94) 11 4369781, 4369782, 4369783
**ෆැක්ස් :** (94) 11 2 501707
**ඊමේල් :** tisl@tisrilanka.org


වෙත -




# හඬ

පළමු වෙළුම - දෙවන ප්‍රකාශය "හඬක් නැති ප්‍රජාවට හඬක් වෙමු" 2020 අප්‍රේල්/ජුනි


මෙම පුවත් හසුන සැකසීමේ සහ තැපැල් කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද භාවිතා කරමින් සිදු කර ඇත.



# සුපිලිපන් මැතිවරණයකට අපිත් දායක වෙමු

1931 යටත් විජිත සමය තුළ හදුන්වාදුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ලැබුණු සර්වජන ඡන්ද බලය ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය නව දිශානතියකට යොමු කරන ලදී. එතැන් පටන් වසර 89ක් පුරා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 4ක් යටතේ අප රටේ පුරවැසියන් තම ඡන්ද බලය නොයෙකුත් තලයන්හි මහජන නියෝජිතයන් පත් කිරීමට භාවිතා කර ඇත. අද වන විට රටේ පළමු පුරවැසියා ලෙස සලකන ජනාධිපතිවරයා ගේ සිට පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ද පළාත් පාලන මට්ටමින් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහා නගර සභා මන්ත්‍රීවරුන්ද පුරවැසියන්ගේ සර්වජන ඡන්ද බලයෙන් පත්කර ගනී.

මැතිවරණයක මූලික බලාපොරොත්තුව වන්නේ යම්කිසි කාලසීමාවකට රට පාලනය කිරීම සඳහා මහජන නියෝජිතයන් පත්කර ගැනීමයි. රටට අවශ්‍ය නීති රීති මෙන්ම රටේ ජනතාවගේ අභිවෘධිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සෑදීම මහජන නියෝජිතයන් විසින් සිදුකරනු ලබයි. ඒ අනුව මැතිවරණ සමයේ දී පාලක පක්ෂ නියෝජිතයන් විසින් රටේ තිරසාර සංවර්ධනය වෙනුවෙන් කල කී දෑ මෙන්ම ජනතවගේ සුභසිද්ධිය සඳහා කරනු ලැබූ මෙහෙවර පදනම් කොටගෙන අනාගතයේදී රට භාරදිය යුත්තේ කාටදැයි තීරණය කිරීමට ඡන්දදායකයාට අවකාශය හිමි වේ.

මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මැතිවරණ කාලසීමාව තුල අපේක්ෂකයන්, දේශපාලන පක්ෂ සහ එහි නියෝජිතයන් මෙන්ම ආධාරකරුවන් මැතිවරණ නීතියට අනුව කටයුතු කල යුතු වේ. තම අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමේ දී කරනු ලබන සැරසිලි, පක්ෂ කාර්යාල ආරම්භ කිරීම්, දේශපාලන රැස්වීම්

**තොරතුරු දැනගැනීමේ පනත හුදෙක් පුද්ගලික අවශ්‍යතා සඳහා වන තොරතුරු දැනගැනීමට එහා ගිය සමාජ වටිනාකමකින් යුත් ක්‍රියාවලියකට දායක විය හැකි මෙවලමකි.**

සංවිධානය කිරීම්, පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම් වැනි ක්‍රියාකාරකම් සදහා නීති රීති පනවා ඇති සේම පොදු දේපල මැතිවරණ කටයුතු වෙනුවෙන් භාවිතා කිරීම වැළැක්වීමට ද දැඩි නීති මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලබයි.

පොදු දේපල යනු රජයට අයත් හෝ රජය විසින් නඩත්තු කරනු ලබන ඕනෑම නිශ්චල හෝ චංචල දේපලකි. මැතිවරණයක් ප්‍රකාශ කිරීමෙන් පසු විවිධ විෂයන්ට අදාලව නියෝග නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා බලය ලැබෙන අතර එකී බලතල ප්‍රකාරව කොමිෂන් සභාව පොදු දේපල අවභාවිතය වැළැක්වීමට අවශ්‍ය නියෝග ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙහිදී පොදු දේපල රාජ්‍ය නිලධාරීන්, රජයේ වාහන, රජයේ කාර්යාල සහ ගොඩනැගිලි, රජය විසින් පවත්වනු ලබන උත්සව, ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන සහ රජය විසින් ලබාදෙන ප්‍රදාන හා විශේෂ ව්‍යාපෘති ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මැතිවරණ සමය තුල මෙම දේපල භාවිතා කල යුත්තේ කෙසේද යන්න විස්තර කෙරේ. උදාහරණක් ලෙස ඡන්දය පැවැත්වෙන කාලසීමාව තුළ දී රජයේ වාහන කිසිදු ආකාරයකින් අපේක්ෂකයන්ගේ මැතිවරණ කටයුතු සඳහා භාවිත කල නොහැකි අතර සියලුම රජයේ වාහන වල ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගෙන යා යුතුයි.

දෙවන පිටුවට →

# තොරතුරු ලබා ගැනීමේ පනත මගින් ගොවි අයිතීන් සුරැකිය හැක්කේ කෙසේද?



කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් විශාල ජනගහනයක් ජීවත් වන අප රටෙහි ගොවීන්ගේ සුභසාධනය නගා සිටුවීම සහ ඔවුන් දිරිමත් කිරීම සඳහා ක්‍රියාකිරීම ගොවිජන සංවර්ධන අධිකාරිය සතු භාරදූර රාජකාරියකි. ඒ සඳහා වෙන්වුණු රජයේ මුදල් නිසි පරිදි භාවිතා වන්නේ ද නැද්ද යන්න සොයා බැලීම සෑම ශ්‍රී ලාංකීය පුරවැසියෙකුගේම වගකීමක් මෙන්ම අයිතියකි. ඒ සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය පුරවැසියන් විසින් සාධනීයව භාවිතා කළ අවස්ථාවන් පිලිබඳ අවධානයට යොමු කිරීම මෙහි අභිප්‍රාය වේ.

ගොවිජන සංවර්ධන අධිකාරියේ පසුගිය වසර පහක කාලය තුළ අරමුදල් වෙන් වූ ව්‍යාපෘති, ඔවුන් කරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳව සහ වලස්මුල්ල ප්‍රදේශයේ කොහොලාන නැමැති කුඹුරට ජලය සපයන ඇළමාර්ගය ප්‍රතිෂ්ඨාපනය නොකිරීමට හේතු දැන ගැනීම පිණිස පුරවැසියකු විසින් තොරතුරු දැන ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන තිබිණි. අධිකාරිය විසින් තොරතුරු ලබාගන්නා ලෙස අයදුම්කරුට දන්වා සිටිය ද අයදුම්කරු විසින් තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව දෙපාර්ශවයම සභාවට කැඳවා අභියාචනා විභාගයක් පවත්වන ලදී. ඒ අනුව අයදුම්කරු හට කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දැක්වීමට අවස්ථාව හිමි විය. කොමිෂන් සභාව සතු සුවිශේෂී බලයක් වන්නේ පොදු අධිකාරියක් විසින් තොරතුරු වලට ප්‍රවේශ වීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර ඇත්නම් එකී අභියාචනා විභාගයෙන් අනතුරුව, අදාල තොරතුරු අයදුම්කරු වෙත නිදහස් කරන ලෙස අණ කිරීමට හිමි වන බලයයි. ඒ අනුව අභියාචනාකරු වෙත අවශ්‍ය තොරතුරු ලබාගැනීමට මෙහි දී හැකියාව ලැබිණි.

පොදු අධිකාරීන් මහජන අරමුදල් භාවිතා කරන අයුරු, අරමුදල් භාවිතා කරමින් සිදුකරන ව්‍යාපෘති පිළිබඳ පුරවැසියන් අවදියෙන් සිටීම කාලීන අවශ්‍යතාවයකි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමට නියමිතව තිබූ ඇළ මාර්ගයක් සංවර්ධනය සඳහා අරමුදල් වෙන්කර තිබුණ ද එම ඇළ මාර්ගය ඉදිකර නොතිබුණු හෙයින් පුරවැසියෙකු තොරතුරු දැන ගැනීමේ අයිතිය භාවිතා කරමින් ඒ පිළිබඳව ප්‍රශ්න කරන ලදී. ඒ අනුව ඔහු විසින් ගොවිජන සංවර්ධන අධිකාරිය සතු උක්ත ව්‍යාපෘතියට අදාළ තොරතුරු රැස් කර ඇති වාර්තාව ඉල්ලා සිටි නමුත් පොදු අධිකාරියෙන් ලද පිළිතුරෙන් සෑහීමට පත් නොවූ හෙයින් කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව ඉදිරියේදී කරුණු දක්වමින් අභියාචනාකරු දක්වා සිටියේ, වෙන් කරන ලද අරමුදල්වලට සිදුවූයේ කුමක්ද යන්න සොයා බැලීමට සහ ව්‍යාපෘතියේ තත්වය දැන ගැනීම පිණිස තොරතුරු අයදුම්කළ බවයි.කෙසේ නමුත් එම වාර්තා දැනටමත් කුලියාපිටිය දිසා අධිකරණයට ඉදිරිපත් කර තිබූ හෙයින් තොරතුරු ලබා දිය නොහැකි බව පොදු අධිකාරිය පෙන්වා දුන්හ. එම අවස්ථාවේ දී කොමිෂන් සභාව පවසා සිටියේ අධිකරණයට ඉදිරිපත් කළ ලේඛන වුවද අයදුම්කරුට ලබාගැනීමට ඉඩකඩ ඇති බවයි. අභියාචනයක දී කොමිෂන් සභාව මගින් පොදු අධිකාරියක් විසින් තොරතුරු ලබා නොදී ඇත්තේ සාධාරණ හේතුවක් මත ද, පොදු අධිකාරිය පනතට අනුකූලව කටයුතු කර ඇත් ද යන්න පරීක්ෂා කර බලා පුරවැසියන්ට තම අයිතීන් දිනා ගැනීමට වඩාත් ඉඩහසර සපයන බව මෙම අභියාචනා විභාගයෙන් පැහැදිලි වේ.

ගොවි ජනතාවට සහන වශයෙන් රජය මගින් ක්‍රියාත්මක කරන මෙවැනි වාරිමාර්ග ව්‍යාපෘති මෙන්ම, පොහොර සහනාධාර වැඩසටහන්, කෘෂිකාර්මික යන්ත්‍ර සඳහා ලබා දෙන සහනාධාර සහ ආහාර භෝග හානියට පත් වූ විට ඒ සදහා ගොවියාට වන්දි ලබා ගැනීමට පවතින හැකියාව හා ක්‍රමවේදයන් මෙන්ම රජය විසින් කොපමණ මුදලක් ඒ වෙනුවෙන් වෙන් කර ඇත්ද, ඒවා ගොවීන් අතර බෙදාහරින්නේ කෙසේ ද ආදීය මෙන්ම නූතන හරිතාගාර ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා කෘෂිකාර්මික ණය ලබා දීම් , ගොවි විශ්‍රාම වැටුප්, ගොවි ජනතාවගේ නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ ආදායම ඉහළ නැංවීමට රජය විසින් කරන වැඩපිළිවෙල වැනි ගොවි ජනතාවගේ ප්‍රශ්න සදහා තොරතුරු ලබා ගැනීමට තොරතුරු දැනගැනීමේ අයිතිය උපකාරී කරගත හැක.

**පළමු පිටුවෙන්**

## සුපිලිපන් මැතිවරණයකට අපිත් දායක වෙමු

පසුගිය මැතිවරණ ලෙස බැලු විට තහවුරු වන කරුණක් නම්, මැතිවරණ සමය තුල බලය හෙබවූ සෑම පක්ෂයක්ම අඩු වැඩි වශයෙන් රජයට අයත් දේපල අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට යොදාගෙන ඇති බවයි. 2016 වසරට පෙර පොදු දේපල යම් ආකාරයකින් අවභාවිතා වීමක් සිදුවුයේ නම් ඒ පිළිබඳව මහජනතාවට සෘජුව අදාල බලධාරීන්ගෙන් ප්‍රශ්න කිරීමට හැකියාවක් හෝ ක්‍රමවේදයක් තිබුනේ නැත. පුරවැසියකු ලෙස ගතහැකි පියවර වුයේ එවක පැවතී මැතිවරණ දෙපාර්තමේන්තුව (වර්තමානයේ මැතිවරණ කොමිෂන් සභාව) වෙත පැමිණිලි කිරීමයි. එසේ වුවද එකී පැමිණිලි සම්බන්ධයෙන් ගන්නා ලද්දේ කුමන ආකාරයේ පියවරක්ද වැරදිකරුවන් නීතියේ රැහැනට හසුකරගත්තාද යන්න ප්‍රගාමීව දැනුම්වත් වීමට යාන්ත්‍රණයක් නොතිබිණි. කෙසේ නමුත් අද වන විට මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට තොරතුරු පනත භාවිතා කිරීමට පුරවැසියන්ට අවස්ථාව හිමි වී ඇත.

මැතිවරණ සමය තුළ දී සිදුකරන සහනාධාර බෙදාදීම්, රැකියා ලබාදීම්, පෞද්ගලික මැතිවරණ කටයුතු සදහා රජයේ ගොඩනැගිලි භාවිතය යනාදී වූ මැතිවරණ රීති උල්ලංඝනය කරමින් සිදුවන ක්‍රියාකාරකම් තොරතුරු අයිතිය භාවිතා කරමින් ප්‍රශ්න කල හැකි අතරම එකී නීති විරෝධී කටයුතු රටට හෙළි කිරීමට ද අවස්ථාව හිමි වේ. මෙම සමස්ත ක්‍රියාවලිය අවසානයේ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට පිටිවහලක් වනු ඇත.



# දින දෙකෙන් තොරතුරු ලබාගනිමු




image - groundviews.org

2019 වසර ශ්‍රී ලංකාව තුල ආන්දෝලනාත්මක සිදුවීම් ගණනාවක් සිදු වූ වසරකි. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වැරදි සදහා අධිකරණය ඉදිරියේ මරණ දඬුවම් ලැබූ සිව් දෙනෙකුට එකී මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට තීරණය වීම ඉන් එක් සිදුවීමකි. “සියලු සිරකරුවෝද මනුෂ්‍යයෝය” යන්න බන්ධනාගාර පිවිසුම් තුල ලියා තිබුණ ද මරණ දඬුවම ක්‍රියාත්මක කළ යුතු ද නැද්ද යන්න අදටත් පක්ෂ සහ විපක්ෂ අදහස් පලවන මාතෘකාවක් බවට තර්කයක් නොමැත. ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් ආයතනයට අනුව 2019 වසර වන විට රටවල් 106ක් මරණ දඬුවම තහනම් කර ඇති අතර රටවල් 56ක තවමත් මරණ දඬුවම ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව මෙම කාණ්ඩ දෙකටම නොවැටුණත්, අප සිටින්නේ මරණ දඬුවම නීතියෙන් තහනම් නොවූවත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොකරන රටවල් අතරයි. ශ්‍රී ලංකාවේ අවසාන වරට මරණ දඬුවම 1976 දී ක්‍රියාත්මක වූ අතර ඉන් පසුව අවුරුදු 43ක කාලයක් පුරා නිසොල්මන්ව තිබූ මෙකී දඬුවම නැවත අපගේ සිත් තුළ දෝංකාර දෙන්නේ ඉහත කී සිද්ධියත් සමගයි.

මෙවැනි සුවිශේෂී අවස්ථාවන්හි දී තොරතුරු අයිතිය භාවිතා කළ හැකිද? ඒ කෙසේද? යන්න අප දැනුම්වත් වී සිටිය යුතුය. සාමාන්‍යයෙන් තොරතුරු අයදුම්පත්‍රයක් පොදු අධිකාරියකට යොමු කල පසු වැඩකරන දින 14ක් තුළ තොරතුරු ලබාදෙනවා ද? නැද්ද? යන්න අයදුම්කරුට දැනුම්දිය යුතුය. කෙසේ නමුත් විශේෂ හදිසි අවස්ථාවක දී සාමාන්‍ය ක්‍රමයෙන් බැහැරව තොරතුරු ක්ෂණිකව ලබාගැනීමට ක්‍රමවේදයක් තොරතුරු පනතින් ස්ථාපනය කර ඇත. පනතේ 25 වන වගන්තියට අනුකූලව ඕනෑම පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස හා සම්බන්ධයෙන් තොරතුරු අයදුම්පතක් යොමු වූ විට ඊට පැය 48 ක් තුල අදාල ආයතනය ප්‍රතිචාර දැක්විය යුතුයි.

පසුගිය වසරේ කලින් සදහන් කල ආකාරයට සිරකරුවන් හතර දෙනෙකුට මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීමත් සමගම පුරවැසියන්, සිවිල් සංවිධාන සහ රාජ්‍ය ආයතන කිහිපයකින් මේ සම්බන්ධයෙන් තොරතුරු විමසීමක් කර තිබිණි. බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය සහ එවක පැවති අධිකරණ අමාත්‍යංශය යන ආයතන ත්‍රිත්වයෙන් මෙලෙස මරණ දඬුවම නියම කල සිරකරුවන්ගේ නම්, අනෙකුත් සිරකරුවන් අතුරින් සිව් දෙනෙකු තෝරාගත් පදනම, මරණ දඬුවම ක්‍රියාත්මක කරන දිනය සහ තවත් ප්‍රශ්න ගණනාවක් මෙම ආයතන වලට යොමු කරනු ලැබිණි.

මෙහි දී සිරකරුවන් හතර දෙනෙකු ට මරණ දඬුවම නියමවීමත් ඒ හරහා ඔවුන්ගේ ජීවිතයට සහ පුද්ගලික නිදහසට තර්ජනයක් ඇතැයි යන පදනම මත මෙකී තොරතුරු පැය 48ක් තුල ලබා දෙන ලෙස ඉල්ලුම් කර තිබීම සුවිශේෂී කරුණකි. මෙම ක්‍රියාදාමයේ තවත් වැදගත් කරුණු දෙකක් ඇත. පළමුව, මෙවැනි අවස්ථාවක දී අභියාචනා ක්‍රියාපටිපාටිය සාමාන්‍යය ක්‍රමයෙන් බැහැර වේ. එනම් අභියාචනා නිලධාරියා වෙත අභියාචනය යොමු කරනවා වෙනුවට සෘජුවම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිලිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කිරීමට අවස්ථාව ලැබේ. දෙවනුව, කොමිෂන් සභාව ඉදිරියේ සිදුවන අභියාචනා විභාගය සතියක් හෝ දෙකක් වැනි ඉතා කෙටි කාලයක් තුල ආරම්භ කිරීමයි. මෙහි සදහන් පළමු සහ දෙවන කාරණා සම්බන්ධයෙන් තොරතුරු පනත මගින් විධිවිධාන සලසා නොමැති වුවත්, ප්‍රායෝගිකව මෙය ක්‍රියාත්මක වන්නේ ඉහත සදහන් ආකාරයටයි.

**විශේෂ හදිසි අවස්ථාවක දී සාමාන්‍ය ක්‍රමයෙන් බැහැරව තොරතුරු ක්ෂණිකව ලබාගැනීමට ක්‍රමවේදයක් තොරතුරු පනතින් ස්ථාපනය කර ඇත. පනතේ 25 වන වගන්තියට අනුකුලව ඕනෑම පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස හා සම්බන්ධයෙන් තොරතුරු අයදුම්පතක් යොමු වූ විට ඊට පැය 48 ක් තුල අදාල ආයතනය ප්‍රතිචාර දැක්විය යුතුයි.**

තමාගේ හෝ ඕනෑම පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස ට බලපෑමක් සිදුවන ඕනෑම අවස්ථාවක දී තොරතුරු පනත හරහා කඩිනමින් තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් ඉහත දක්වා ඇති පරිදි තොරතුරු පනත හරහා හදුන්වා දී ඇත. ඒ අනුව මරණ දඬුවම හා සම්බන්ධ අභියාචනයේ දී ද කොමිෂන් සභාව ඉහත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කඩිනමින් අභියාචනා විභාගය කිරීම අගය කලයුතු අතර පුරවැසියන් ලෙස අප ද මේ සම්බන්ධයෙන් දැනුම්වත් වී සිටීම අත්‍යාවශ්‍යය කරුණකි.